Kumari, M.M. Nayana N.
PAPER

**හින්දි නාට්‍යයෙන් සිදුවන සමාජ මෙහෙවර පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (මෝහන් රාකේශ්ගේ නාට්‍ය ඇසුරින් )**

M.M. Nayana Nuwan Kumari, Department of Hindi, University of Kelaniya

හින්දි නාට්‍ය සාහිත්‍යයේ ප්‍රතිභාපූර්ණ නාට්‍යකරුවෙකු වන මෝහන් රාකේශ්ගේ නාට්‍යවලින් සිදුවන සමාජ මෙහෙවර පිළිබඳ විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි.
මෝහන් රාකේශ් නාට්‍ය ක්ෂේත්‍රයට පිවිසෙන්නේ ස්වතන්ත්‍රතා අරගලයෙන් පසුවය. මේ වනවිට භාරතීය ජන සමාජය අධිරාජ්‍යවාදී පාලනයේ බලපෑම් වලට හසුවී තිබුණි. නිදහසෙන් පසු භාරතයේ සමාජ, දේශපාලන, සංස්කෘතික හා ආර්ථික පෙරළිය සූක්ෂම ලෙස තම නාට්‍යයට ග්‍රහණය කරගත් නාට්‍යකරුවෙකු ලෙස මෝහන් රාකේශ්ගේ සාහිත්‍ය භූමිකාව වැදගත් වේ.
ඔහු විසින් රචිත නාට්‍ය සංඛ්‍යාව හතරකි. එම සෑම නාට්‍යයක් ම විවිධ මානයන්ගෙන් විමර්ශනයට ලක් වූ අතර ඔහු විසින් රචිත 'ආධෙ අධූරේ' නාට්‍යය ධනේශ්වර සමාජ ක්‍රමය හමුවේ දියාරු වී යන භාරතීය මානව හා පවුල් බන්ධනයන් අතිශය සූක්ෂම ලෙස පිළිබිඹු කරන නාට්‍යයක් ලෙස සැලකේ.
මෝහන් රාකේශ්ගේ නාට්‍ය සමතලයක තබා විග්‍රහ කළ නොහැකිය. ස්වතන්ත්‍ර භාරතයේ ජන සමාජයේ විවිධාකාර පෙරළි චිත්‍රණය කිරීමට පමණක් නොව සමාජය වෙනස් කරන බලවේගවලට මගක් පෙන්වීමට ඔහුගේ නාට්‍ය තුළින් ලැබුණු ආලෝකය සාකච්ඡාවට ලක්විය යුතු විෂයකි. ඒ අනුව සිංහල නාට්‍ය සාහිත්‍යයට මෙතෙක් විවර නොවුණු මෝහන් රාකේශ්ගේ නාට්‍ය තුළින් ඉටුවන සමාජ මෙහෙවර පිළිබඳ විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමේ වැදගත්කම මෙහිදී ඉස්මතු කරගත හැකිය. අධ්‍යයනයේ පෘථුලත්වය හේතු කොටගෙන මෝහන් රාකේශ්ගේ 'ආධෙ අධූරේ' නාට්‍යය වෙත මෙහිදී කේන්ද්‍රීය අවධානය යොමු කෙරේ.

මුඛ්‍ය පද: යටත් විජිතවාදය, ස්වාධීන භාරතය, භාරතීය සමාජ පෙරළිය, මෝහන් රාකේශ්, ආධෙ අධූරේ